# ජාතික අධ්‍යාපන ආයතනය
# බ්‍රේල් සහතිකපත්‍ර පාඨමාලාව - 2025
## ඉල්ලුම්පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම් කිරීම සඳහා සුදුසුකම් :**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.ස. උසස් පෙළ විභාගය සමත්වීම හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
- රජයේ පාසල්, උපකෘත පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ කටයුතුවල නියුක්ත ගුරුවරයෙකු වීම.
- දෘෂ්ටි ඌණතා සහිත දරුවන් සිටින දෙමව්පියන්වීම හෝ එම දරුවන් සමග කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අයෙකු හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයෙකු වීම.
- වයස අවුරුදු 18 – 55 අතර වීම. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

| | | | | |
|---|---|---|---|---|
| **පාඨමාලා කාලය** | : | මාස 06 කි. (සති අන්තයේදී පාඨමාලා පැවැත්වේ) | | |
| **මාධ්‍යය** | : | සිංහල | | |
| **ගාස්තු** | : | පාඨමාලා ගාස්තු | - | රු. 25,000.00 (වාරික 2 කින් ගෙවිය හැකිය) |
| | | අයදුම්පත් ගාස්තු | - | රු. 200.00 |
| | | ලියාපදිංචි ගාස්තු | - | රු. 1,000.00 |

**පාඨමාලවේ අන්තර්ගතය :**

- බ්‍රේල් ඉගැන්වීම පිළිබඳ කුසලතා
- බ්‍රේල් මගින් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) භාෂා කුසලතා
- බ්‍රේල් ගණිත කුසලතා
- බ්‍රේල් සඳහා වෙනත් සහ නව භාවිත (බ්‍රේල් ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත්ය)

**අයදුම් කළ යුතු පිළිවෙළ :**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස https://www.exams.nie.lk/intakes/new මාර්ගගතව පමණක් අයදුම්පත්‍ර යොමු කළ යුතුය.

ඉල්ලුම්පත්‍ර යොමු කිරීමේදී මතුවන තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් උපදෙස් සඳහා – 0117601777 / 0117601776 යන දුරකථන අංක අමතන්න. (ප.ව. 2.00 – ප.ව. 4.00 දක්වා)

**අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය :** 2025.03.31

**මහාචාර්ය මංජුලා විතාණපතිරණ (PhD)**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.**
**2025.03.03**

**(අයදුම් කිරීමේ මාර්ගෝපදේශ සඳහා මෙම QR Code එක Scan කරන්න)**